Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# පාසල් උපදේශන සේවාව සිසුන්ගේ අධ්‍යාපන ඵලදායීතාවය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යනයක්

***ඩබ්.ඩී.මහේෂිකා*** [1]
***කුමුදු සුමේදා*** [2]

සංක්ෂේපය

ඉගෙනුම් ක්‍රියාවලිය සිසුන්ගේ අභියෝගතාවන්, හැකියාව, ළැදියාව, ආකල්ප සහ ශිෂ්‍යකුගේ අධ්‍යාපනික අරමුණුවලට අනුකූල නොවන විට අපේක්ෂිත සාධන මට්ටමට යා නොහැකි වේ. මේ නිසා ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ශිෂ ්‍යන්ට පවුල් පරිසරය, පාසල් පරිසරය, කායික සාධක, ශිෂ්‍ය කණ්ඩායම්, ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිත ගැටලු ආදී ගැටලු රැසකට මුහුණපෑමට සිදුව තිබේ. එකී සාධක ශිෂ්‍යන්ගේ අධ්‍යාපන ඵලදායීතාවය කෙරෙහි නිශේධාත්මකව බලපාන අවස්ථා බහුල වේ. ඉන් ළමුන් මුදවා ගැනීම සඳහා පාසල් තුළ උපදේශනය ස්ථාපිත කර ඇත.

එකී අරමුණින් පාසල් තුළ ස්ථාපිත කර ඇති උපදේශන සේවාව සිසුන්ගේ අධ්‍යාපන ඵලදායීතාව කෙරෙහි බලපා ඇති ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වෙයි. මේ අනුව මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයක් වන අතර සිද්ධි අධ්‍යයනය නම් මූලික පර්යේෂණ විධික්‍රමය භාවිත කරමින් සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. ඒ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ රත්නාවලී බාලිකා පාසල ඇසුරින් අරමුණුගත නියැදිය යටතේ සිද්ධීන් 10 ක් මුල් කර ගනිමින් අවශ්‍ය තොරතුරු රැස්කර ගන්නා ලදී.

මෙම පර්යේෂණයේදී ලබා ගන්නා ලද තොරතුරු අනුව අනාවරණය වූයේ ඵලදායී ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය වන කුසලතා අත්කර ගැනීමට අවශ්‍ය ශක්තිය ලබාගැනීමට ප්‍රේරණයක් උපදේශන සේවාව මඟින් ලැබෙන බවයි. තවද මෙම අරමුණ යම්තාක් දුරට සාර්ථක වුවද උපදේශකයාගේ පුහුණුව ප්‍රමාණවත් නොවීම , පාසල් පරිසරයේ බලපෑම, විභාග මුල් කරගත් අධ්‍යාපන ක්‍රියාවලිය උපදේශනය පිළිබඳව සිසුන්ගේ, දෙමාපියන්ගේ හා ගුරුවරුන්ගේ පවතින නිශේධාත්මක ආකල්ප ආදී කරුණු පාසල් උපදේශන සේවාවේ සාර්ථකත්වයට බාධාවන් වන බව පෙන්වා දිය හැකිය.

ප්‍රමුඛ පද - පාසල් උපදේශනය, අධ්‍යාපනය, ඵලදායීතාවය.